# ඇසී ගැන කතාවක්



සයුරි නිම්සරා නානායක්කාර

කෘතියේ නම : ඇස ගැන කතාවක්

කතෘගේ නම : සයුරි හිම්සරා නානායක්කාර

කතෘ අයිතිය : සයුරි හිම්සරා නානායක්කාර

කෘතිය පළ කරන දිනය : 2025-02-08

ISBN අංකය : 978-624-208-655-2

# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡේද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි. දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුලින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාවම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරඳන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන හෙරණගත්කරණී ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සදහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,
ශෂිකලා සේනාධීර,
මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.



ඔන්න එකමත් එක ගමක තිසරි කියලා ළමයෙක් හිටියා. ඇය ගොඩක් නපුරුයි. හිතුවක්කාරයි. ඇයට ඕන දේවල් අනිවාර්යයෙන්ම ඕන. නැතිනම් හොඳටම අඬනවා. අඬලා අඬලා ඇස් රතු කරගන්නවා. කන්නෙත් නෑ. බොන්නේත් නෑ. දවසක් එයා තාත්තාට කිව්වා,



''අනේ තාත්තේ මට ගවුමක් ගේන්නකෝ'' කියලා. තාත්තා කිව්වා ''හරි පුතේ තව දවස් තුනක් ඉවසන්න'' කියලා.

''මට දවස් තුනක් ඉවසන්න කොහෙත්ම බෑ'' කියලා තිසරි අඬන්න පටන් ගත්තා.



ඔන්න ඉතින් තිසරි දවස් 3 ක් තිසරි වගේ නෙමෙ පොඩි ළමයෙක් වගේ අඬනවා. දවස් 3 ක්ම කන්නෑ, බොන්නෑ, අඬනවා. එක පාරටම ඇස කතා කරන්න ගත්තා.




“අනේ ළමයෝ ඔයා ඔච්චර අඬන්න එපා. මම ගොඩක් තුවාල වෙලා. මට ගොඩක් රිදෙනවා. ඔය කඳුළු වගේ ගලන්නේ මගේ ලේ.



දැන් මගේ ලේ කොච්චර ගිහිල්ලා ඇති ද ? ගංගාවක් වගේ.’’ ඔයා මං ගැනත් හිතන්න. ඔච්චර නපුරු වෙන්න එපා. ඔයා හොඳ ළමයෙක් වෙන්න.

‘‘හරි මම අද ඉදන් හොඳ ළමයෙක් වෙන්නං’’

‘‘අන්න හරි දැන් හොඳයි’’ කියලා ඇස කිව්වා.



ඒ එක්කම කඳුළු ගංගාවක් වගේ ගලලා තිසරීව කාමරේ දොර ඇරීලා ගසා ගෙන ගියා. අම්මයි, තාත්තයි තිසරීව අල්ලා ගත්තා. " අනේ තාත්තේ මට සමාවෙන්න. මං ආයේ කවදාවත් අඬන්නේ නෑ." කියලා තිසරී කිව්වා ඇස කිවු කතාවත් කිව්වා. ඉන්පසු කවදාවත් තිසරී ඇඬුවේ නෑ. තාත්තා හරී සතුටුයි. එදා ඉදන් කවදාවත් තිසරී ඇඬුවේ නෑ. තිසරී ලොකු වෙලා, ගුරුතුමියක් වුණා.




ඇය ළමයින්ට තමන්ට වුණ සිද්ධි කියා කවදාවත් නාඬන ලෙස කිව්වා. ළමයිනුත් ඇගේ කතා අසා සතුටින් සිටියා. හැමදාම කවදාවත් ඇඬුවේ නෑ.

අපිත් කවදාවත් අඬන්නේ නැතුව සිටිමු. හොඳ ළමයි වෙමු. හැමදාම ඇඬුවොත් මුහුණ කැත වෙනවා. හිනා වුණොත් මුහුණ ලස්සන වෙනවා.



''ඔන්න ඔහොම කතාව අවසන් වෙනවා'' එහෙම කිව්වේ කසුනිගේ තාත්තා. ඒ කියන්නේ මේක කතාවක්. කසුනිගේ තාත්තා කසුනිට හැමදාම නිදියන කොට කතා කියලා දෙනවා. ''තාත්තේ මම අහපු කතාවලින් ලස්සනම කතාව ඒක'' කියලා කසුනි කිව්වා.



කසුනි පුදුම උනේ ඇස කතා කළා කියද්දි.
''තාත්තේ ඇත්තටම ඇස් කතා කරනවාද ?''
කියලා කසුනි තාත්තගෙන් ඇහුවා.



"නෑ පුතේ ඇත්තටම ඇස් කතා කරන්නෙ නෑ සමහර පොත් වල සත්‍ය සිදුවීම් ද සමහර පොත්වල අසත්‍ය සිදුවීම් ද තියෙනවා දුවේ," තාත්තා කීවා. තාත්තා කීව කතාවත් හිතේ තබාගෙන කසුනි නින්දට ගියා.

# පසුවදන



රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මාණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදී මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාකෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනාකරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ. තම නිසග, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,
සෙනෙවිරත්න මහලේකම්

978-624-208-655-2